සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 09 - 2023**

## ක්‍රිස්තු ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I - කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 01 සිට 20 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරන්න.

(01) දේව මැවිල්ල පිළිබඳ ව ශුද්ධ බයිබලයේ සඳහන් ග්‍රන්ථය කුමක් ද?
(i) නික්මයාම ය. (ii) උත්පත්ති ය. (iii) ජොහාන් ය. (iv) එළිදරව්ව ය.

(02) දාවිත් රජුට ඊර්ෂයා කළ රජතුමා කවුරුන් ද?
(i) සාවුල් ය (ii) ජොනතන් ය (iii) මෝසෙස් ය (iv) ජාකොබ් ය

(03) නෝවා දෙවිඳුන් ඉදිරියේ,
(i) ප්‍රේමයෙන් ජීවත් විය. (ii) ධර්මිෂ්ඨව ජීවත් විය.
(iii) බෙදා හදාගෙන ජීවත් විය. (iv) ප්‍රීතියෙන් ජීවත් විය.

(04) කිතුනු අපගේ විශ්වාසයේ කර්තෘ වන්නේ කවුරුන් ද?
(i) ජේසුස් වහන්සේ ය. (ii) දෙවියන් වහන්සේ ය.
(iii) ආදම් සහ ඒව ය. (iv) ශුද්ධාත්මයාණන් වහන්සේ ය.

(05) එලියා දිවැසිවරයා පෝෂණය ලැබුවේ කාගෙන් ද?
(i) සමාරියේ ස්ත්‍රියගෙන් ය. (ii) නායින් නුවර වැන්දඹුවගෙන් ය.
(iii) ගාබ්‍රියෙල් දේව දූතයාගෙන් ය. (iv) ශාරපෙත් හි වැන්දඹුවගෙන් ය.

(06) රාජ්‍ය නිලධාරියාගේ පුත්‍රයා රෝගාතුරව සිටියේ කොහේ ද?
(i) බෙතානියේ ය. (ii) නාසරතයේ ය. (iii) කපර්ණාමුවෙහි ය. (iv) තාර්සසස්හි ය.

(07) ජුදා ජන ජීවිතයේ අතිශය වැදගත් දිනය වන්නේ කවදා ද?
(i) පාස්කු දිනය යි. (ii) ස්වර්ගාරෝහණ දිනය යි.
(iii) පෙන්තකොස්ත දිනය යි. (iv) සබත් දිනය යි.

(08) ''ශුද්ධාත්ම බලයෙන් පූර්ණ ව .............................. විසින් බොහෝ හාස්කම් සිදු කරන ලදී''. මෙහි හිස්තැනට සුදුසු වචනය කුමක් ද?
(i) ප්‍රේරිතයන් (ii) මරියතුමිය ය. (iii) ලාසරස් ය. (iv) පරිසිවරුන් ය.

(09) ''තබීතා'' යන්නෙහි අර්ථය කුමක් ද?
(i) සිංහ ධේනුව ය. (ii) කාන්තාව ය. (iii) වැන්දඹුව ය. (iv) මුව දෙන ය.

(10) ශ්‍රාවකයන් ට ශුද්ධාත්ම දානය ලැබුනේ කවදා ද?
(i) මහා සිකුරාදා ය. (ii) පෙන්තකොස්ත දින ය.
(iii) සබත් දිනය ය. (iv) මහා බ්‍රහස්පතින්දා දිනය ය.

(11) අප සියලු ම දෙනාගේ ගැලවීම උදෙසා ජීවමාන පූජා යාගයක් ලෙස පූජා වූයේ කවුරුන් ද?
(i) දෙවියන් වහන්සේ ය. (ii) ශුද්ධාත්මයාණන් වහන්සේ ය.
(iii) ජේසුස් වහන්සේ ය. (iv) පාවුල් තුමා ය.

(12) ස්තේපන්ට ගල් ගැසූ තරුණයන්ගේ ඇඳුම් රැක බලා ගැනීමේ වගකීම දැරූ පුද්ගලයා කවුරුන් ද?
(i) සාවුල් ය. (ii) මෝසෙස් ය. (iii) දාවිත් ය. (iv) ජොහාන් ය.

(13) ''රන් වන් රිදීවත් මට නැත, එහෙත් මට ඇති දේ ඔබට දෙමි'' මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද?
(i) ලූක් ය. (ii) ජුදස් ය. (iii) මතෙව් ය. (iv) ජේදුරු ය.

(14) මෙපිබෝෂෙත් ව ආදරයෙන් රැක බලා ගත්තේ කවුරුන් ද?
(i) නෝවා ය. (ii) සාවුල් ය. (iii) එලියා ය. (iv) දාවිත් ය.

(15) දෙවියන් වහන්සේ මිනිසාට අනාවරණය වන ප්‍රබලත ම මාර්ගය වන්නේ කුමක් ද?
(i) දේව වචනය යි. (ii) යාච්ඤාවයි. (iii) ගීතිකාවයි. (iv) දිව්‍ය පූජාවයි.

(16) පාවුල් තුමා එපීස ලිපිය ලියනු ලැබුවේ කොහේ දී ද?
(i) දේව මාලිගයේ දී ය. (ii) උත්තම පූජක මැදුරේ දී ය.
(iii) තම නිවසේදී ය. (iv) සිර මැදුරේදී ය.

(17) තමකම නැසීම පිළිබඳව අප වෙත මහඟු ආදර්ශයක් ලබා දුන්නේ කවුද?
(i) දෙවියන් වහන්සේ ය. (ii) ආදම් ය.
(iii) ජේසුස් වහන්සේ ය. (iv) ආබ්‍රහම් ය.

(18) කිතුනු අපගේ සන්නාහ සන්නද්ධ ආයුධවල දී ''ගැලවීම'' සමාන කරනුයේ කුමකටද?,
(i) හිස් වැසුමට ය. (ii) පලිහට ය. (iii) වහන්වලට ය. (iv) ඉඟ පටියට ය.

(19) කිතුනු දරුවකු ලෙස අප තුළ නොතිබිය යුතු ලක්ෂණයක් වන්නේ කුමක් ද?
(i) සමාව දීම ය. (ii) අලසකම ය. (iii) පරාර්ථකාමී බව ය. (iv) කාරුණික බව ය.

(20) නව යොවුන් වියේ සිටින ඔබ සැම විටම,
(i) ඔබ කැමති දේ කළ යුතුය. (ii) සමාජය කැමති දේ කළ යුතුය.
(iii) මිතුරන් කැමති දේ කළ යුතුය. (iv) දේව කැමැත්තට ඉඩ දිය යුතුය.

## II - කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

---

(01) කෙටි පිළිතුරු සපයන්න.

(i) ජේසුස් වහන්සේ යාච්ඥා කළ අවස්ථා 02 ක් ලියන්න.

(ii) ජේසුස් වහන්සේ සිදු කළ පළමු ප්‍රාතිහාර්ය කුමක් ද? එය සිදු කළේ කොහේදී ද?

(iii) කිතුනුවකු වන අප සන්නාහ සන්නද්ධ විය යුතු යුද්ධායුධ 02 ක් ලියන්න.

(iv) ශුද්ධ වූ පාවුල් තුමා විසින් ලියන ලද ලිපි 2 ක් ලියන්න.

(v) මුල් කිතුනු සභාවට පීඩා එල්ල කළ කණ්ඩායම් 2 ක් ලියන්න.

(vi) ජේසුස් වහන්සේගේ අනුගාමිකයෙකු වීමට සපුරා ලිය යුතු ගුණාංග 2 ක් ලියන්න. (මතෙව් 16 : 24 ට අනුව)

(vii) ක්‍රිස්තුස් වහන්සේ තුළ නව ජීවිතයක් අත් කර ගැනීමට අවශ්‍යය ගුණාංග 2 ක් නම් කරන්න.

(viii) හාරදහසකට (4000) කෑම දීමේ ප්‍රාතිහාර්ය සඳහා ජේසුස් වහන්සේ යොදා ගත්තේ මොනවා ද?

(ලකුණු 2 × 8 = 16)

(02) (i) දාවිත් රජුගේ ධාර්මිෂ්ඨකම ප්‍රකාශ වූ අවස්ථා 2 ක් ලියන්න.

(ii) දාවිත් රජුගේ දිවියෙන් ඔබේ දිවියට ලැබෙන ආදර්ශ 03 ක් ලියන්න.

(iii) ඔබ පංති කාමරයේ විශේෂ අවශ්‍යතා ඇති මිතුරෙකුට ඔබට කළ හැකි උපකාර 03 ක් ලියන්න.

(ලකුණු 2+3+6 = 11)

(03) (i) ''ඔබේ වචන මාගේ දෙපයට ............................ මාගේ මාවතට ..............'' මෙහි හිස්තැන්වලට සුදුසු වචන යොදා බයිබල් පාඨය සම්පූර්ණ කරන්න.

(ii) දේව වචනය අවබෝධ කර ගැනීම සඳහා ඔබට මඟ පෙන්වන පුද්ගලයින් තිදෙනෙකු නම් කරන්න.

(iii) දේව වචනය කියවීම තුළින් ඔබේ දිවියට ලැබෙන ආලෝකය කෙසේ ද? කරුණු තුනක් ලියා පහදන්න.

(ලකුණු 2+3+6 = 11)

(04) (i) ශුද්ධ වූ පාවුල් තුමා සිරභාරයට ගනු ලැබුවේ මන්ද?.

(ii) අද සමාජය තුළ නපුරු බලවේග පැමිණෙන ස්වරූප 3 ක් ලියන්න.

(iii) ජේසුස් වහන්සේගේ යුධ සෙබලෙකු ලෙස කිතුනු ඔබ මෙහෙවරෙහි යෙදෙන්නේ කෙසේදැයි කරුණු තුනක් ලියන්න.

(ලකුණු 2+3+6 = 11)

(05) (i) එදිනෙදා දිවියේදී අපට මුහුණ දීමට සිදුවන ස්වභාවික ව්‍යසනවලට උදාහරණ 02 ක් ලියන්න.

(ii) දෙවියන් වහන්සේ අඳුර මැදින් අපගේ බිය දුරුකරන අවස්ථා සඳහා උදාහරණ 03 ක් ලියන්න.

(iii) දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තබා ගනිමින් ඔබගේ ජීවිතයට ආ පීඩාවන් ජයගත් අවස්ථාවක් විස්තර කරන්න. (ලකුණු 2+3+6 = 11)

(06) (i) ජේසුස් වහන්සේ ව අනුගාමී වන්නන් සමාන කරන්නේ කාට ද?

(ii) මිනිසා තමන් පිළිබඳව ඉහළින් සිතනා කරුණු 03 ක් ලියන්න.

(iii) ආධ්‍යාත්මික ලෙස නව ජීවිතයක් කරා යොමු වීමට නම් කිතුනු දරුවෙකු තුළ තිබිය යුතු ගුණාංග 6 ක් ලියන්න. (ලකුණු 2+3+6 = 11)

(07) (i) ක්‍රිස්තුස් වහන්සේ තම ශ්‍රාවකයන්ව කැඳවන ලැබුවේ කුමක් සඳහා ද?

(ii) ගරු ජේම්ස් එම්. ඩැරල් දේවගැති තුමා විසින් සිදු කළ විශේෂ සේවාව කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) ක්‍රිස්තුස් වහන්සේට අයත් වූවෙකු ලෙස තමකම නසමින් අන් අය වෙනුවෙන් වැය වීමට පාසල් දරුවෙකු ලෙස ඔබට කළ හැකි කාර්යයන් 3 ක් ලියන්න. (ලකුණු 2+3+6 = 11)